1st Place Winner
National Productivity
Award 2020

ISO 9001
ISO/IEC 17021
QMS-001-01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
# பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
# CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| මගේ අංකය / எனது இல. / My Ref. | CSS/03/13/CIR.COM.(3) | ඔබේ අංකය / உமது இல / Your Ref. | | දිනය / திகதி / Date | 2025.07. 28 |
|---|---|---|---|---|---|

ලේකම්,
ප්‍රධාන අමාත්‍යාංශය,
දකුණු පළාත.

**<u>පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාර ව දකුණු පළාත් සභාව සඳහා චක්‍රලේඛ අදාළ කර ගැනීම සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ පොදු චක්‍රලේඛ ලිපි අංක 01-17/2025 හා පොදු චක්‍රලේඛ ලිපි අංක 01-22/2025</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මා ඇමතූ දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක SP/PSC/05/01/30 හා 2025.07.23 දිනැති ලිපිය හා බැඳේ.

02. දකුණු පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාර ව පහත සඳහන් චක්‍රලේඛ දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීම සඳහා 2025.07.15 දිනැති ව දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය ලැබී ඇති බව මා වෙත දැනුම් දී ඇත.

| අනු අංකය | චක්‍රලේඛය නිකුත් කළ ආයතනය | චක්‍රලේඛ අංකය හා නිකුත් කළ දිනය | චක්‍රලේඛයේ ශීර්ෂය |
|---|---|---|---|
| 01. | සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | පොදු චක්‍රලේඛ ලිපි අංක - 01-17/2025<br>2025.04.30 | ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය අත්හිටවූ වෛද්‍ය නිලධරයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම |
| 02. | සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | පොදු චක්‍රලේඛ ලිපි අංක - 01-22/2025<br>2025.05.07 | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතින් ලබා ගැනීමට ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම සඳහා වූ මාර්ගෝපදේශ |

02. ඒ අනුව, එම කාරණය පිළිබඳ අදාළ ආයතන දැනුවත් කිරීමට කටයුතු කරන මෙන් කාරුණික ව දන්වා සිටිමි.

රනිල් වික්‍රමසේකර
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)
ප්‍රධාන ලේකම් වෙනුවට
දකුණු පළාත

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 4944002
කාර්යාලය / காரியாலயம் / Office 091 4119011 091 2234052
ෆැක්ස් / தொலைநகல் / Fax 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

"සෞභාග්‍යමත් දකුණු පළාතක්"

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, දකුණු පළාත
மாகாண அரசாங்க சேவை ஆணைக்குழு தென் மாகாணம்
PROVINCIAL PUBLIC SERVICE COMMISSION, SOUTHERN PROVINCE
දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය සංකීර්ණය,6 වන මහල,කළුවැල්ල, ගාල්ල. / மாவட்டச் செயலாளர் ஒன்றியம்,6ம் மாடி, கலுவெல்ல, காலி. / District Secretariat,6th Floor, Kaluwella, Galle.

මගේ අංකය / எனது இல / My No: SP/PSC/05/01/30

ඔබේ අංකය / உமது இல / Your No.:

දිනය / திகதி / Date: 2025.07. 23

24 JUL 2025

ACS / A

ප්‍රධාන ලේකම්
දකුණු පළාත

**පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාරව දකුණු පළාත් සභාව සඳහා චක්‍රලේඛ අදාල කර ගැනීම සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ පොදු චක්‍රලේඛ ලිපි අංක. 01-17/2025 හා පොදු චක්‍රලේඛ ලිපි අංක. 01-22/2025**

ශීර්ෂගත කරුණ සම්බන්ධව, ඔබගේ අංක. CSS/3/13/CIR.COM(2) හා 2025.06.19 දිනැතිව මා වෙත යොමු කරන ලද ලිපිය හා බැඳේ.

02. එකී ලිපියේ සඳහන් ඉල්ලීම පරිදි දකුණු පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාරව පහත සඳහන් චක්‍රලේඛයන්හි විධි විධාන දකුණු පළාතට අදාල කර ගැනීම සඳහා 2025.07.15 දිනැතිව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක. GS/SP/EST/1/1/01 හා 2025.07.16 දිනැති ලිපියෙන් මා වෙත දැනුම් දී ඇති බව කාරුණිකව දැනුම් දෙමි. අනුමැතිය සහිත එම චක්‍රලේඛයන්හි සහතික කරන ලද ඡායා පිටපතක් බැගින් මේ සමඟ අමුණා එවමි.

| චක්‍රලේඛය නිකුත් කළ ආයතනය | චක්‍රලේඛයේ අංකය හා දිනය | චක්‍රලේඛයේ ශීර්ෂය |
|---|---|---|
| සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | පොදු චක්‍රලේඛ ලිපි අංක. 01-17/2025 හා 2025.04.30 | ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය අත්හිටවූ වෛද්‍ය නිලධරයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම |
| සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | පොදු චක්‍රලේඛ ලිපි අංක. 01-22/2025 හා 2025.05.07 | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතීන් ලබා ගැනීමට ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම සඳහා වූ මාර්ගෝපදේශ |

සී.පී. රාජකරුණා
ලේකම්
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

සී.පී. රාජකරුණා
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
දකුණු පළාත

දුරකථන / தொலைபேசி / Telephone
සභාපති/தலைவர்/ Chairman : 091-2222497
ලේකම්/செயலாளர்/ Secretary : 091-2233366
සහකාර ලේකම්/உதவி செயலாளர்/Asst.Secretary: 091-2248450
කාර්යාලය/அலுவலகம்/Office : 091-2234309
ෆැක්ස් / பெக்ஸ் / Fax: 091-2228811
ඊ-මේල් / ஈ-மெயில் / e-mail: secretary@psc.spgov.lk

පොදු චක්‍ර ලේඛ ලිපි අංක - 01-17/2025

මගේ අංක : TCS/T 30/GMOA/2023
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය",
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත
කොළඹ 10.
26.04.2025

පළාත් ප්‍රධාන ලේකම්වරු, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරු, පළාත් සෞඛ්‍ය ලේකම්වරු
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ජාතික රෝහල කොළඹ සහ මහනුවර,
ජාතික, ශික්ෂණ, පළාත්, හා දිස්ත්‍රික් මහා රෝහල් සහ විශේෂිත රෝහල් සහ මහජන සෞඛ්‍ය ආයතනවල අධ්‍යක්ෂවරු, පළාත් හා දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරු,
මූලික රෝහල් වෛද්‍ය අධිකාරීන් සහ සියලුම ආයතන භාර වෛද්‍ය නිලධාරීන් වෙත,

**ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය අත්හිටවූ වෛද්‍ය නිලධරයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම.**

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය නිලධරයෙකුගේ ලියාපදිංචිය අත්හිටුවා ඇති අවස්ථාවකදී එම නිලධාරියා සේවයේ යෙදවීම සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කළ යුතු බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

I. වෛද්‍ය ආඥා පනත ප්‍රකාරව ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සේවයේ වෛද්‍ය නිලධරයෙකුගේ ලියාපදිංචිය අත්හිටවූ විට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ ආවරණ අනුමැතියට යටත්ව සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් එම වෛද්‍ය නිලධරයාගේ සේවය වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවිය යුතුය. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිලධරයාගේ වෛද්‍ය සභාවේ ලියාපදිංචිය අත්හිටුවීමට තීරණය ගත් දින සිට ඉදිරියට එය ක්‍රියාත්මක විය යුතුය.

II. වෛද්‍ය නිලධරයෙකුගේ සේවය ඉහත පරිදි අත්හිටුවා ඇති කාල සීමාව වැටුප් රහිත කාලයක් ලෙස සැලකිය යුතු අතර, එසේ ඛණ්ඩනය වූ සේවා කාලය ඔහුගේ/ ඇයගේ සක්‍රිය සේවා කාලය ගණනය කිරීමේදී බැහැර කළ යුතුය. වෛද්‍ය නිලධාරයා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය නැවත ලබාගෙන ඉදිරිපත් කළ පසු නිලධාරියා නැවත සේවයේ පිහිටුවිය යුතුය.

III. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් වෛද්‍ය නිලධරයාගේ ලියාපදිංචිය අත් හිටුවීමට පාදක වූ කරුණු සම්බන්ධයෙන්ම විනය බලධරයෙකු විසින් එකී නිලධරයා සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීම හෝ එසේ විනයානුකූලව කටයුතු කිරීමේදී නිලධාරියාට එරෙහිව විනය බලධරයා විසින් ගනු ලබන නියෝගයක් හෝ තීරණයක් ක්‍රියාත්මක කිරීම ඉහත 01 හෝ 02 ඡේදයන්හි සඳහන් ක්‍රියාමාර්ග වලට ස්වාධීන වශයෙන් සිදුවිය යුතුය.

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්

පිටපත් : ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව